# අනඳ මුතු

අප්පමාදෙ අමතපදං

පළමුවාර කලාපය 2025

මංගල කලාපය



## ආනන්දයට ජාත්‍යන්තර ජයක්

## අනඳ මුතු ආනන්දයට ආඩම්බරයක්

කවරයේ ඡායාරූපය
**මංජුල මාකොල**

ආනන්ද විද්‍යාලයීය ප්‍රාථමික අංශයෙන් පිදෙන සාඩම්බර තිළිණයක්

## සංස්කාරකවරු


අනුශාසකත්වය
දැරංගල සිවරතන හිමි


උපදේශකත්වය
ඩී.එම්.එල්.පී. දිසානායක
(විදුහල්පති)


මගපෙන්වීම
නුවන් ප්‍රියන්ත
(සහකාර විදුහල්පති)


ප්‍රධාන සංස්කාරක
ජනක රාමවික්‍රම


නිරෝමා සුරවීර


සඳුනි නිශංශක


මධූකා ජයසූරිය


ඉනෝකා රාජකරුණා


සමන්ති කුමාරි


උදිතා රුවන්පතිරණ


දේවිකා බණ්ඩාර


රසාංගිකා හෙට්ටිආරච්චි

# 'අනඳ මුතු'ට සුභාශිංෂණ පතමු

## නව මානයකින් ලොව දකිමු නව දැක්මකින් ලොව කියවමු

ලොව මෙතෙක් ආ ගමනේ සාර්ථකත්වයට හේතුව නිර්මාණශීලි බවයි. ලොව මෙතෙක් වූ සාර්ථකත්වයේ ස්ථාවරත්වයට හේතුව ලේඛනයයි. එනයින් නිර්මාණාත්මක ලේඛනය ලොව පැවැත්මට සෘජු දායකත්වයක් දක්වයි. කුඩා අවදියේ පටන් නිර්මාණශීලි මනසකින් ලොව දකින්නට පෙළඹවීම අධ්‍යාපනයේ මූලික අරමුණක් බව අපි විශ්වාස කරමු . ඒ සඳහා මනා රුකුලක් 'අනඳ මුතු' සඟරාව පුංචි ආනන්දියයන්ට ලබා දෙනු ඇත. තමන්ගේ නිර්මාණ තවදුරටත් බිත්ති පුවත්පතකට සීමා නොකොට එය ඩිජිටල් අවකාශයේ වූ පුළුල් පාඨක සමාජයක් කරා ගෙන යන්නට දරණ මෙම වෑයම පිළිබඳ , තම දරුවන්ගේ සාර්ථකත්වය දැක සතුටු වන පියෙකුගේ ස්නේහයෙන් යුතුව තුටු වෙමි. පුංචි අංකුර කලාකරුවන්ට , ලේඛකයන්ට මං පෙන්වන ප්‍රාථමික අංශයේ සහකාර විදුහල්පතිතුමන් 4 වන ශ්‍රේණියේ ශ්‍රේණි ප්‍රධාන සහ ආචාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පල කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමු.

දිනෙක නව මානයකින් ලොව දකින්නට නව දැක්මකින් ලොව කියවන්නට හැකි වේවායි පුංචි ආනන්දියයන්ට සුබ පතමි.

අනඳ මාතාවගේ සරණයි!



**ඩී. එම්. එල්. පී. දිසානායක**
**විදුහල්පති**
**ආනන්ද විද්‍යාලය**

## දරුවන්ට මගපෙන්වන්නෝ වැඩිහිටියෝ ය

ළමයින්ගේ මනස පුදුමාකාරය. ඔවුහු මවාගත් සුරංගනා ලෝකයන් තුළ රිසිසේ කෙළි දෙලෙන් ගත කරති. මේ නැවුම්, නිමැවුම් මනස මනා හැසිරවීමකින් තවදුරටත් ඔපමට්ටම් කොට ලෝකයට දායාද කරන්නට වෙර දරණ අනඳ මුතු සඟරාව යුගයේ නව ප්‍රවණතා හඳුනාගෙන සැලසුම් සහගතව ඉදිරිපත් කළ එකක් බව පෙනෙයි. දරුවන්ට මගපෙන්වන්නෝ වැඩිහිටියෝ ය. ඒ දැක දරුවෝ එමග යති. එයන මග හරි එකක් වී නම් ගමනාන්තය සුන්දර වන්නේ ම ය. දරුවන්ගේ අනාගතය සුන්දර කරනු වස් අද දවසේ දරුවන් කැටුව මංපෙන්වන 4 වන ශ්‍රේණියේ ශ්‍රේණි ප්‍රධාන ඇතුළු ආචාර්ය මණ්ඩලයට ස්තුති පූර්වක සුභාෂිංසන ගෙන එමි. පැහැදිලි අනාගතයේ සිතුවම් වර්ණ කරන පුංචි ආනන්දියයනි ඔබට සුබ පතමි.

අනඳ මාතාවගේ සරණයි!

**නුවන් ප්‍රියන්ත**
**සහකාර විදුහල්පති**
**ආනන්ද විද්‍යාලය**
**ප්‍රාථමික අංශය**





අනඳ මුතු
අසව් අසව්

මාර්තු 12 බදාදා
මැදින් පුර පසළොස්වක පෙර පොහොය වැඩසටහන
3 ශ්‍රේණිය

අප්‍රේල් 10
ආනන්දේ අවුරුද්දේ - 2025
බක්මහ සැනකෙළිය

**ජීවිතයට වදනක්**

**කියවා නොදැනුවත් වීම කුඹුරු කොටා නොවැපිරීම බඳු ය.**

**To read without understanding is like ploughing without sowing.**









# පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කළ ටා





2025 වසර සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ අධ්‍යාපන අමාත්‍යංශ ජාතික වැඩසටහනට සමගාමීව කොළඹ ආනන්ද විද්‍යාලයද පසුගියදා පුංචි ආනන්දියයන් පාසලට ඇතුළත් කර ගැනීම උත්සවශ්‍රීයෙන් සිදුකරන ලදී. ප්‍රධාන ආරාධිතයා ලෙස ළමාරෝග විශේෂඥ වෛද්‍ය ආදී ආනන්දීය හැරිස් පතිරගේ මහතා සහභාගී වූ මෙම සමාරම්භක උත්සවය අර්ථවත් කිරීම සඳහා ආදි ආනන්දිය 97 කණ්ඩායම දායක වීම ඉකුත් වසරවලදී මෙන් ම මෙවරද සිදු විය.

කොළඹ කලාපයේ බොරැල්ල කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකතුමිය , ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිතුමන්, පාසල් සංවර්ධන සමිතියේ ලේකම්තුමන් ආදී කොටගත් සුබ පතන්නන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවය දෙවන ශ්‍රේණියේ පුතුන්ගේ ගායන නර්තන කුසලතාවන්ගෙන් අපූරුවට හැඩගැන්වුණි.

## හොඳම සහතික ලත් නොව හොඳ ම උමතුව ඇති පුද්ගලයා සේවයට ගන්න

**Don't hire solely based on qualifications: hire those who are passionate.**

ජීවිතයට වදනක්

# අනඳ මුතු

## ගුරු වැකිය

දෙමාපියනි,

පොත පතින් උගත් දැනුමට එහා ගිය දැනුමක් ජීවත්වීම උදෙසා අවැසිය. තවදුරටත් ලෝකය තුළ පවතිනවාද වියැකෙනවාද යන්න එමගින් තීරණය කරනු ඇති. එනිසා දරුවන්ට ප්‍රායෝගික පුහුණුව හා අද්දැකීම් ළඟා කරවන අන්දමේ අවස්ථා උදාකරවීම ගුරු දෙමාපියන්ගේ වගකීමයි. හැදෙන දරුවන් ඉවක් බවක් නැතිව වන පියසක හැදෙන ගසක් බඳුය. සාත්තුවක් නොමැත්තේ ඒ ගස් හිතුමතේ වැඩෙයි. පාලනයක් නොවෙයි. හදන දරුවන් මනා වූ පාලනයකින් සාත්තුවකින් යුතුව ගෙඋයනක වැඩෙන විසිතුරු ශාකයක් වැන්න. එය දුටුවන් සතුටු කරවන අපූරු නිමැවුමකි. දරුවන්ට හැදෙන්නට ඉඩ නොතබා හදන්නට අවැසි වන්නේ එහෙයිනි. හදන දරුවන් ලෝකයට ඵලදායී අන්දමින් හැඩගැස්විය යුතුය.

පුතනුවනි,

ලෝකය අපූර්ව නිමැවුමකි. එහි වෙසෙන අපූර්ව ආකාරයේ සත්ත්වයෙකු වීම අපගේ අභිලාෂය විය යුත්තේ මය. කවුරුත් ආදරේ කරන කවුරුත් අගයන ආකාරයේ පුද්ගලයෙකු ලෙස පෙනී සිටීම සඳහා වෙසෙසින් වෙහෙසිය යුතුය. එය අහම්බයක් හෝ ඉබේ සිදුවන්නක් නොවේ. ඒ සඳහා ඔබ තුළ ඇති ආකල්ප සංවර්ධනය කරගැනීම අත්‍යවශ්‍යය. එමෙන්ම නොනිත් වූ කුසලතාවයන් ප්‍රගුණ කළ යුතු ය. දැනුම සොයා යන්නෙකු විය යුතුය. ඔබ අපූර්ව මිනිසෙකු ලෙස පෙනී සිටීම කිසිවෙකුටත් වළක්වාලිය නොහැක.

අධ්‍යාපනය මේ ඉලක්ක සපුරාලීමට හැකිවන පරිදි සැලසුම් කිරීම වගකීමයි. එය අනාගත ලෝකයේ අවශ්‍යතා හඳුනාගෙන මනා වූ සංවිධානයකින් සකස් කළ යුතුය. එසේ සකස් වූ කළ රටක සංවර්ධනය දුර ඈතක නොවනු ඇත.

සෑම විටම ඔබව විශ්වාස කරන්න. ඔබේ හැකියාව විශ්වාස කරන්න. ඔබට කළ නොහැකි දේ පසෙක තබා කළ හැකි දේ උපරිමයෙන් කරන්න. වෙනසක් කිරීමට අන් අයට ආරාධනා කරනවාට වඩා වෙනසක් කිරීමට මුළ පිරීම වඩා ඵලදායී වනු ඇත. ඒ ආරම්භය නිසාවෙන්ම අපි බලාපොරොත්තු වූ සඵලදායී වෙනස ඉටුකිරීම උදෙසා පිරිස් රොද බැඳෙනු ඇත. ගුරුභවතුනි, දෙමාපියනි, පුතණුවනි, අපි වෙනස් ලෙස සිතීම ආරම්භ කරමු. වෙනස් ආරම්භයකින් වෙනස් වැඩක් කරමු. වෙනස් ලෙසකින් ලෝකය දිනමු.

ඔබට අනඳ මාතාවගේ සරණයි !



**ජීවිතයට වදනක්**

## ඉගෙනීම යනු දුප්පතාගේ ධනයයි. පොහොසතාගේ ආභරණයයි.

**Learning is a treasure for the poor and a crown for the rich**



# රටක් වටින රටක්

## ජාතික කොඩිය

ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වූ ඩී.ඇස්.සේනානායක මහතා විසින් 1950 වර්ෂයේදී කමිටුවක නිර්දේශයක් මත මෙම ජාතික කොඩිය නිර්මාණය කරවීය. 1978 වර්ෂයේ දී වර්තමාන ජාතික කොඩිය එළිදක්වන ලදී.



## ජාතික පක්ෂියා

ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වළි කුකුළාවේ. ප්‍රමාණයෙන් කුඩා සිරුරක් ඇති වර්ණවත් දිගු පිහටුවලින් යුක්ත පෙදයක් ඇති දිගැටි සත්වයෙකි. ශ්‍රී ලංකාවට පමණක් ආවේණික එඩිතර සටන්කාමී කඩිසර දේශීය පක්ෂියෙකු වන වලි කුකුලාගේ ඉංග්‍රීසි නාමය *Ceylon jungle* දෙඅක ය. වියළි කලාපයට අයත් ප්‍රදේශවල වැඩිපුර දක්නට ලැබේ. තෙත් කලාපිය කඳුකර පහත් බිම්වලත් දක්නට ලැබේ.

## ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලන සමයේ දී සිලෝන් ලෙස හැඳින්වූ අතර වර්තමානයේ නිල වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ලෙස හඳුන්වයි. ශ්‍රී ලංකාව සෙරන්ඩිබ්, සිලොන්, දීප්තිමත් දිවයින, ධර්ම දිවයින, ඉන්දියන් සාගරයේ මුතු ඇටය නමින්ද හඳුන්වයි. විවිධ නම් ගණනාවකින් පුරාණයේ හැඳින්වූ මෙම දූපත "නම් දහසක් ඇති දූපත" ලෙස ප්‍රචලිත ද විය.




මෙය දකුණු ආසියානු දූපතකි. එය ඉන්දියානු සාගරයේ, බෙංගාල බොක්කෙහි නිරිත දෙසින් සහ අරාබි මුහුදේ ගිනිකොන දෙසින් පිහිටා ඇත. එය ඉන්දියානු උප මහද්වීපය මන්නාරම් බොක්ක සහ පෝක් සමුද්‍ර සන්ධිය මගින් වෙන් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ පිහිටීම ප්‍රධාන මුහුදු මාර්ගවල පිහිටීම හේතුවෙන් බටහිර ආසියාව සහ අග්නිදිග ආසියාව අතර උපායමාර්ගික නාවික සම්බන්ධකයක් ලෙස එය පුරාණ කාලයේ සිටම භාවිතය ගැණුනි. ශ්‍රී ලංකාවට ආසන්න ම රටවල් ලෙස ඉන්දියාව සහ මාලදිවයින හැඳින්විය හැකි ය.

ශ්‍රී ලංකාවේ විශාලත්වය වර්ග කි.මී 65,610 (වර්ග සැතපුම් 25,330) වේ. එය ලොව 123 වැනි විශාලතම රට වන අතර විශාලතම දූපත් අතරින් 25 වන ස්ථානයෙ සිටියි. එහි භූමි ප්‍රදේශය පළාත් නවයකට සහ දිස්ත්‍රික්ක විසිපහකට වෙන් කර ඇත. රට පළාත් 9 කින්, දිස්ත්‍රික්ක 25 හා ප්‍රදේශිය ලේකම් කොට්ඨාසය 331 හා ග්‍රාම නිලධාරී කොට්ඨාස 14,022 කින් සමන්විත වේ. අගනුවර ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ වන අතර විශාලතම නගරය කොළඹ වේ. කොළඹ ජාතියේ ආර්ථික, දේශපාලන කේන්ද්‍රස්ථානයයි.

ශ්‍රී ලංකාව ලෝක උරුම ස්ථාන අටක්, සැතපුම් ගණනක් පුරා විහිදුනු රන්වන් වැලි සහිත වෙරළවල්, වැසි වනාන්තර සහ කඳුකර තේ වතු සහිත ඉතා සුන්දර දූපතකි. නිවර්තන වනාන්තර, වෙරළ සහ භූ දර්ශනවල ස්වභාවික සුන්දරත්වය, ජෛව විවිධත්වය මෙන්ම පොහොසත් සංස්කෘතික උරුමයන් සඳහා ප්‍රසිද්ධය, එය ලෝක ප්‍රසිද්ධ සංචාරක ගමනාන්තයක් බවට පත් කළේය.

ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 22 කට ආසන්න වේ. එය දූපතක ජීවත් වන 11 වන විශාලතම ජනගහනයයි. බහුවිධ හා බහුසංස්කෘතික රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව, බොහෝ ආගම්, ජන වර්ග සහ භාෂා රැසකට නිවහන වේ. දිවයිනෙහි බහුතරය වූ සිංහල ජනතාවට අමතරව, එහි අනෙකුත් සුළු වාර්ගික කණ්ඩායම් ලෙස ශ්‍රී ලාංකික දෙමළ, ඉන්දියානු දෙමළ, මරක්කල, බර්ගර්, මැලේ, කාපිරි සහ ස්වදේශීය වැදි ජනතාව වාසය කරනු ලබයි. නිල භාෂාව සිංහල භාෂාව සහ දෙමළ භාෂාව වේ.

ශ්‍රී ලංකාව යනු පොහොසත් සංස්කෘතික උරුමයක් ඇති රටකි ශ්‍රී ලංකාවේ ලිඛිත ඉතිහාසය වසර 3000ක් පමණ අතීතයට විහිදෙන අතර සහ සාක්ෂ්‍ය සහිත ප්‍රාග් ඓතිහාසික මානව ජනාවාසයන්ගේ ඉතිහාසය අවම වශයෙන් වසර 125,000ක් දක්වා විහිදේ. ඉතා පොහොසත් බෞද්ධ උරුමයක් සතු ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉතිහාසමය බෞද්ධ ලේඛනය පාලි ත්‍රිපිටකයයි.



ජනක රාමවික්‍රම
ආනන්ද විද්‍යාලය
කොළඹ 10



## ජාතික සත්තවයා

ශ්‍රීලංකාවේ ජාතික සත්ත්වයා, වන දඬුලේනා දුර්ලභ ගණයේ සත්ත්වයෙකි. ඉංග්‍රීසි භාෂාවෙන් Sri Lanka Giant Squirrel ලෙස හඳුන්වන දඬුලේනා දෙමළ භාෂාවෙන් පෙරයා අනිල් ලෙස හැඳින්වේ. විද්‍යාත්මක නාමය *Ratufa Macroura Meianochra* ය. තෙත් කලාපයේ වනාන්තරවල සහ සදාහරිත වනාන්තරවල මෙම ලේනුන් බහුලව ජීවත්වන අතර මධ්‍යම කඳුකරයේ ඌව හා දකුණු වනාන්තරවල, අනුරාධපුරය, මිහින්තලය, කණ්ඩලම, දඹුල්ල, මාතලේ, වස්ගමුව, වයඹ පළාත් යන ප්‍රදේශයන්හි ද ජීවත් වෙති.



## ජාතික වෘක්ෂය

නා ගස ශ්‍රී ලංකාවට ආවේණික නිවර්තන වෘක්ෂයකි. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය ද මෙය වෙයි. මෙම ශාඛයේ දැව ඉතා දැඩි ස්වභාවයක් ගන්නා බැවින් ඉංග්‍රීසි භාෂාවෙන් "අයන් වුඩ්" ලෙස හඳුන්වනු ලැබේ. සෙවණ සදන විසල් අතු පතරින් සහ සුවඳවත් මලින් ද යුක්ත මෙම ශාකය නිවර්තන දේශගුණ කලාපවල සරුවට වැඩේ. ශ්‍රී ලංකාවට ආවේණික වුව ද ඇසෑම්, දකුණු නේපාලය, ඉන්දු චීනය සහ මැලේ අර්ධද්වීපය වැනි ප්‍රදේශවල ද වගා කරනු ලැබේ.



## ජාතික පුෂ්පය

*Nymphaea stellata* යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හැඳින්වන මෙම මල ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වේ

ඔබ අත් නොහරින තාක්, ඔබට අවස්ථාව ඇත.

If you don't give up, you still have a chance.

ජීවිතයට වදනක්

# සිතුවම් පුවරුව

පැන්සලට වඩා පින්සලෙන් කියන්න පුළුවන් දේවල් බොහොමයි. ඉතා සියුම්ව වර්ණවත්ව ආකර්ෂණීය අයුරින් එහෙම කියන්න නම් සතත අභ්‍යාසයේ යෙදෙන්න ඕන. එහෙව් බලාපොරොත්තු ඇති අනාගතයේ මහා චිත්‍ර ශිල්පීන්ගේ සේයා මවන අංකුර පුංචි අනඳ චිත්‍ර ශිල්පීන්ගේ සිතුවම් එකතුවක් අද සිතුවම් පුවරුව හැඩ කරනවා.


අබිනු අනුජය
4-1


දිනුල් විමලසූරිය
4-5


යුහස් දිනුල
4-3


දනිඳු කෞෂල්‍ය
4-6


සත්සිඳු ධනපාල
4-4

ජීවිතයට වදනක්

## ඔබට තිබිය යුතු ඉතා වැදගත් දේ නම් ඉවසීමයි.

**Patience is the most essential quality one should possess.**



යෙනිදු රාජපක්ෂ
4-2



රිසිදු ජෙනුජ බණ්ඩාර රත්නායක
4-2



සන්හිත් දිනුලක
4-5



දිනර වික්‍රමරත්න
4-6



සමිතු වින්දිවි
4-3



අයෝද්
4-5

**ජීවිතයට වදනක්**

**මට අවශ්‍ය ඇල්ම ලබන්නකු වීම නොව, ගරුත්වය ලබන්නකු වීමටයි.**

**I don't seek to be liked; I seek to be respected.**

### MY Pet

1. My pet is a dog
2. It's name is Teenu
3. It's a female dog
4. It's favourite toy is my ball

4.But i'm sad, dead

5. I love my pet.

**Saveth**

**4-6**





### The Environment

The environment is very beautiful and our surrounding is called the environment.

Trees, rivers, animals and mountains are in the environment.

Every morning sun peers over the mountains, bathing the worlk with golden light.

Unfortunately, humans pollute the environment.

We have to protect our environment.

**E.P.T. Vindul**

**4-6**

### My Self

1. My name is Raneth,
2. I am 8 years old.
3. I live in Maradana.
4. My school is Ananda College.
5. I am in grade 3.
6. I have a brother and no sisters.
7. I like to eat pasta.
8. I like to drink Coca Cola.
9. My hobby is drawing pictures.
10. My ambition is to be a scientist.

**Raneth kaggodaarachchi**

**4 -1**

Once upon a time there were six friends in London. There were Trenuk, Kenuth, Senew, Senuth, Chenitha and Saven. They lived in a scary ground. They saw a bungalow. They went inside the bungalow and began to check. Kenuth said "Let's go upstairs". Trenuk saw a scary ghost. Trenuk was freaked out and shouted. Kenuth said "why man what's the meaning of this? A ghost? Oh my god, me too" said Kenuth. Senuth fought with the ghost. Chenitha went to the washroom and locked the door. Then Trenuk, Saven, Senev, Kenuth all came in to the car and they went home.

**Trenuk Romel**

**4 - 1**

ජීවිතයට වදනක්

# උගතුන් හුදු වංශාධිපතීන්ට වඩා උසස් ය.

## Scholars are superior to mere nobles.

### MY best friend

1. My best friend is Manaarya
2. He's turning nine this August.
3. He loves to play tennis.
4. He also loves to play chess with me.
5.He lives in Angoda.
6. He has a sisiter.
7. she studies at Musaeus colleage.
8. His favourite food is pizza.
9. His favourite cartoon is Ben 10
10. I like my best friend a lot.

**Athraja**
**4-2**





### MY Country

1. My Country is Sri Lanka
2. It is a small island surrounded by the Indian Ocean.
3. It's Capital city is Colombo.
4. Sri Lanka has a long and proud history.
4.Sri Lanka is rich in natural beautiul
5. I Love my Country.

Dinula Randinu
4-6

### Elephant and friends

Once upon a time there was a lonely elephant who roamed in a forest looking for friends. He tried to befriend with a monkey, a rabbit, a frog and a fox. But they all said no because he was so large. The following day, a tiger began to chase the animals causing them a panic. The elephant went up to the tiger and asked him to stop bothering his friends. So the tiger ran away seeing the elephant's bravery. All the animals realized that he was just the right size to be their friend.

**Senitha Rathnayake.**
**4 - 1**

### MY Pet

I have a pet dog.
It's name is Bily.
Bily is small.
It is brown and black.
It has a nice tall.
I like to play with him

**Vinul Sasvidu**
**4-2**



ජීවිතයට වදනක්

# මිනිසකු ඉගෙනීම නතර කළ විට ඔහුගේ වර්ධනය ද නවතියි.

**When a man stops learning, he also stops growing.**

## රබන් පද හඳුනා ගනිමු

සිංහල හින්දු අලුත් අවුරුදු මංගල්‍යයේදී ප්‍රධාන අංගයක් වන රබන් වැයීම සඳහා යොදා ගන්නා කවි රබන් පද වේ. විශාල පිරිසකට එක්ව වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩයකි රබාන. රබන් වර්ග රාශියක් ඇත. ඒ අතරින් බංකු රබාන අලුත් අවුරුදු මංගල්‍යයේදී කාන්තාවෝ කිහිප දෙනෙකු එකට එක්ව වාදනය කරති.

උඩින් උඩින් වර පෙත්තප්පු
බිමින් බිමින් වර පෙත්තප්පු
උඩින් උඩින් වර බිමින් බිමින් වර
කැවුම් කන්න වර පෙත්තප්පු

**රිතුම් කාරියවසම්**
**3-4**



## සිංහල දෙමළ අලුත් අවුරුද්ද

1. එය සමරනු ලබන්නේ සිංහල සහ දෙමළ ජාතිකයන්ය.
2. එය උදා වන්නේ අප්‍රේල් මාසයේදීය.
3. අවුරුද්ද ළං වෙද්දී ගස්, වැල්, මල්, පලතුරු හා ගෙඩිවලින් පිරී යයි.
4. කොහාගේ නාදය නිතර ඇසෙන්නට ගනියි.
5. එම නිසා අවුරුදු මාසය ''බක් මාසය'' යැයි කියනු ලැබේ.
6. සංහල දෙමළ අලුත් අවුරුද්ද ලෙසින් අපි සමරන්නේ හිරු මීන රාශියේ සිට මේෂ රාශියට පැමිණීමයි.
7. සිංහල අවුරුද්දට අපි නව සඳ බැලීම, ළිප ගිනි මෙලවීම, ආහාර අනුභවය හා හිස තෙල් ගෑම වැනි චාරිත්‍ර සිදු කරමු.
8. අවුරුදු උත්සවවලදී අලියාට ඇස තැබීම, ලිස්සන ගහේ නැගීම, කොට්ට පොර ගැසීම වැනි ක්‍රීඩා කරයි.
9. අපි සිංහල අවුරුද්දට පංච දැමීම, ඔන්චිලි පැදීම වැනි ජන ක්‍රීඩා කරමු.
10. අපි අවුරුද්දට සෑම නිවසකම සිංහල හා දෙමළ ජනයාගේ කැවිලි වර්ග සාදමු.
11. අපගේ සියලු නෑදෑ හිත මිතුරන් සියලු දෙනා සමගිව එකතු වී සතුටින් මෙම උත්සවය සමරනු ලබති.

**විනුත් තෙව්මින්**
**4-5**



## සීගිරිය

1. සීගිරිය නිර්මාණය කරන ලද්දේ කාශ්‍යප රජු විසිනි.
2. එය පිහිටා ඇත්තේ දඹුල්ල නගරයට ආසන්නවය.
3. සීගිරිය කැටපත් පවුරේ කුරුටු ගී සහ බිතු සිතුවම් ලෝකයේ ප්‍රසිද්ධය.
4. සීගිරිය නැරඹීමට බොහෝ සංචාරකයෝ සීගිරියට එති.
5. සීගිරිය ලෝක උරුමයකි.
6. කාශ්‍යප රජු බිතු සිතුවම් ඇඳීමේදී බදාම තට්ටු තුනක් භාවිත කර ඇත.
7. චිත්‍ර ඇඳීමට පාට සාදාගෙන ඇත්තේ ගල්කුඩු, ගස්වල මල් කොළ, පොතු, පස්, මැටි, වතුර, තෙල් වර්ග වලිනි.
8. සීගිරි ජල උද්‍යානයේ ඇති වතුර මල් පොකුණු අවුරුදු සිය දහස් ගණනක් පැරණි වුවද ඒවා තවමත් ක්‍රියාත්මකව පවතී.
9. ලෝක ප්‍රසිද්ධ සීගිරිය රැක ගැනීම අපේ යුතුකමකි.

**සනුල් කෙත්මිර**
**4-5**

## අපේ පැරණි ජන කවි

ඔන්න මලේ ඔය නාමල නෙලා　　වරෙන්
අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා　　වරෙන්
කැලණි ගඟේ ඔරු යනවා බලා　　වරෙන්
සාදුකාර දී ඔරුවක නැගී　　වරෙන්



මේ තියෙන්නේ ලොකු, පුංචි අපි හැමෝම දන්නා ජන කවියකි. ජන කවි යනු අපේ මුතුන් මිත්තන් නොයෙක් අවස්ථාවලදී හිතට නැගුණු අදහස් කියූ ආකාරයකි. රෑට හේන සතුන්ගෙන් ආරක්ෂා කරන විට පාළුව, බය නැති කර ගැනීමට ඔවුන් පැල් කවි කීවා. ඒ වගේම තවලම් යන විට මහන්සිය නිවා ගැනීමට ඔවුන් කරත්ත කවි කීවා. ගොයම් කවි, පතල් කවි, පාර ඤකවි තවත් ජන කවි වර්ග කිහිපයකි. මේවා පරම්පරාවෙන් පරම්පරාවට කටින් කට පැවතගෙන එයි.

**තිනුග හරිස්චන්ද්‍ර**
**4-5**

ජීවිතයට වදනක්

# හොඳ පොත් තරම් සුමිතුරෙක් නැත.

## A good book is a true and steadfast companion



### රෑ අහස

රෑ අහසේ හඳ මාමා එබී බලා   හිනහුණා
හඳ මාමගෙ පුංචි ළමයි කහ පාටින්   දිලිසුණා
ඒ වගේම රෑ අහසේ ග්‍රහලෝකත්   පාවුණා
ඒ අතරින් මේ අතරින් වළාකුළුත්   පාවුණා

හඳ මාමා දිලිසෙනකොට බලන්න හරි   ආසයි
තරු දරුවන් පාවෙනකොට අහස තවත් ලස්සනයි
මා වවුලෝ පියාඹති කණාමැදිරියන්ද   ඇදෙයි
බකමුණන් ශබ්ද නගා ඒ මේ අත   පියාඹයි

**ලිතුලය රහල්**
**4-4**



### කොරෝනා කාලයේ

උණු වතුරත් දානවා
ඇල් වතුරත් දානවා
ලුණු චුට්ටක් මුසු කරලා
කට සෝදා ගන්නවා

**අබිරු අනුහස්**
**4-3**

### අනඳ මව් තුරුල...

සුදු කොක්කු රෑනක් සේ
උදයම සුපිපුණ සුවඳ මල් වගේ
අපි සැවොම අනඳ මව් තුරුලට
හැමදාම පියනැගුවෙමු
දෙගුරුන්ගෙ ආදරය මැද
අප අකුරු එකතු කර
මුතු පොටක මුතු සේ
හැඩ කළෙමු ජීවිතය
ටිකෙන් ටික ලොකු වෙද්දි
අපි ඔටුනු පළඳද්දි
හිනැහුණා විදුමව්නි ඔබ
ආදරය පුරවගෙන

**ඊ.ජේ.පී. විහස් වින්දුල්**
**4-6**




### වලාකුළු

පුළුන් බෝලයක්   වාගේ
ඈත අහසේ   පාවෙන්නේ
හවසට හරි ලස්සන   වේ
ඉර හඳ යට   හිනැහෙන්නේ

පාවි පාවි ලෝකෙ   වටේ
සුළඟ සමග දිව   යන්නේ
දැවටි දැවටි කඳු   අතරේ
අපට සිසිල ලැබ   දෙන්නේ

**ලකිඳු නිතිෂ්**
**4-3**



### රෝස මල්

රතු පාටට රතුම රතෙන්
අපෙ නංගිගෙ දෙකොපුල් මෙන්
රතු පාටට සිනහ නගයි
කෘමි සතුන්ට සිනහ පිරෙයි

වත්ත පුරා සුවඳ හමයි
බට්ටි මලිත්තෝ නටතෙයි
දැකුම් කළුයි වත්ත පුරා
රෝස මලින් වත්ත පිරෙයි

**බිනෙත් යෙනුක**
**4-3**

### උදෑසන

කුරලු ගීත නද දෙනා
ලස්සන හිමිදිරි වුණා
උදෑසනම නැගිටිනා
පුංචි ළමයි අපි වෙනා

අම්මා වටේ දැවටෙනා
හුරතලේට කියවනා
අම්මා උයන සැටි බලා
නවතින්නට සිත් වුණා

තාත්තාගේ ඔවදනා
ඉගෙන ගන්න වෙහෙසෙනා
සුදෝ සුදින් බැබළෙනා
පාසල වෙත යම් සදා

**කිත්නුක සහස්**
**4-5**



### උදෑසන

උදෑසන ම ඉර පායා රැස්   විහිදෙනවා
කුරුල්ලන්ගේ නාදෙ අසා සතුටු   හිතෙනවා
පාට පාට මල් පිපිලා සුවඳ   හමනවා
චූටි ළමයි හරි සතුටින් පාසල්   යනවා

### රාත්‍රිය

රෑ අහසේ හඳ පායා සිසිල   දැනෙනවා
වවුලන් බකමූණන්ගේ නාදේ   ඇසෙනවා
සුදු පාටට පුංචි පුංචි මල්   පිබිදෙනවා
චූටි චූටි කණාමැදිරි එළි   දැල්වෙනවා

**යශොද්**
**4-5**

### අම්මයි තාත්තයි

සඳක් වගේ සිසිලක් මට දුන්   අම්මා
මලක් වගේ සුන්දර මගේ සුදු   අම්මා
හැමදාමත් මට ආදරේ මගේ   අම්මා
මමත් ආදරෙයි කවදත් සුදු   අම්මා

උදේ ඉඳන් රෑ වෙනකන් වැඩ කරනා   තාත්තා
හරිම හිනා විහිළු කතා කියනා මගෙ   තාත්තා
පොත් පැන්සල් අරන් දෙන්නෙ මගෙ ආදර තාත්තා
මට ආදරේ මම ආදරෙ කවදත් මගෙ   තාත්තා

**රමිත විතාන්**
**4-1**

## දුක්පීඩා තරම් අධ්‍යාපනය ලෙන දෙන වෙන දෙයක් නැත.

**Adversity is the best teacher**

ජීවිතයට වදනක්

# මී මැසි පුවත



> “මනුෂ්‍යයා ජීවත්වන්නේ මී මැස්සා ජීවත් වන තෙක් පමණයි. මී මැස්සන් සදහටම තුරන් වී ගිය දවසේ සිට මිනිසාට ජීවත් විය හැක්කේ උපරිම අවුරුදු 4කි”
>
> *-ඇල්බර්ට් අයින්ස්ටයින්-*

මී මැස්සා කියන්නේ පරමාදර්ශීම සත්ත්වයා. අපේ ආහාර වෙනුවෙන් අපි කෘතවේදී වෙන්න ඕනේ මී මැස්සන්ට. මොකද මේ පරාගනනයන් 70%ට වැඩි කොටසක් ඉටු කරන්නේ මේ පුංචි කෘමියා.
සාමාන්‍ය මී වදයක මී මැස්සෝ 60,000 විතර ඉන්නවා. ඒත් එක රැජිණයි! රැජිණ කවුද කියල තෝරන්නේ මී මස්සන්ම තමයි. රාජ ජල්ලි කවල හොඳ පෝෂණයක් නිරෝගි බවක් සපලතාවයක් ලබා දෙනවා. ඒ නිසාම රැජිණ අවුරුදු 5 විතර ජීවත් වෙනවා. මැගෙන් බලාපොනරාත්තු වෙන්නේ වර්ගයා බෝ කිරීම පමණයි!!!! මී මැසි ගනාවසයේ අනිත් හුඟ දෙනා, වැඩකරන මී මැස්සියෝ.
මිනිත්තුවකට 12000 වාරයේ තටු සලමින්,පැයකට සැතපුම් 15ක වේගයෙන් පියාඹන,දිනකට මල් 2000ක් සොයාගෙන ඒ ගැන යාළුවන්ටත් දන්වන මී මැස්සා,විවේකයක් ගැන නම් හිතන්නෙවත් නෑ. තද වෙහෙසක් නිදිමතක් දැනුනොත් විතරක් මලක් උඩ තත්පර ගාණක් ඇහැ පියාගන්නවා.
මේ තරම් මහන්සි වෙලත් මී මැස්සේක් තමන්ගෙ මුලු ජීවිත කාලෙම හදන්න තේ හැන්දෙන් 1/12ක මී පැණි ප්‍රමාණයක්!
මී මැස්සන්ගේ සන්නිවේදන ක්‍රමය බොහොම ලස්සනයි, ඒක නැටුමක්! නැටුමෙන් තොරතුරු හුවමාරු මාධ්‍ය කරගන්නා එකම සත්වයා මී මැස්සා. මල් තියෙන්නේ කොහෙද, කොච්චර දුරකින්ද, දිශාව මොකද්ද ,රස කොහොමද, ආපහු කොලනියට එන්නේ කොහොමද මේ ඔක්කොම දන්නවන්නේ උඩට පහළට වමට දකුණට හැරි හැරී කරන නැටුනමන්. තල ඇටයක තරම් මොළයක් තිබ්බත් නියුරෝන දහස් ගණනින් නිර්මිත
මොළයක් නිසා හොඳ මතකයක් තියන සතෙක් මේ. ඒ නිසාම අපි වගේම හීන දකිනවලු
නින්දේදී...මී මැස්සෙක් තම ගනාවාසය බේරගන්න ජීවිතය පුද දෙන්න දෙසැරයක් හිතන්නෙ නෑ. මී මැස්සා විදිද්දී මී මැසි තුඩ එක්කම ආමාශයෙන් කොටසකුත් ගැලවිලා එළියට එනවා. ඒ කියන්නේ මී මැස්සා විදින්නේ මැරෙන බව දැනගෙන. ඒ වගේම තමන්ගෙ ආයු කාලය ඉවර බව දැනුනොත් මී වදයෙන් එළියට යන්නේ






මෘතසිරුරෙන් කොලනියට වන හානිය වළවන්න. පාරසරික සමතුලිත බවටත් ජීවී පැවැත්මටත් මහඟු සේවයක් කරන,ඒත් කිසිදු සත්වයෙක් සිය ගොදුර බවට පත්කරනොගන්නා එකම සත්වයායි මේ පුංචි කෘමියා. ලෝකයට 'නරක් නොවන එකම ආහාරය සකසාදී සති 4ක 5ක කෙටි ජීවිතයෙන් සමුගන්නේ මුලු ලොවටම ආදරය, විනයගරුකබව, පරිත්‍යාගශීලීත්වය පිළිබඳ වටිනා පාඩමක් උගන්වමින්!!!!



නිරෝමා සුරවීර
ආනන්ද විද්‍යාලය
කොළඹ 10



ජීවිතයට වදනක්

## පොතක්, සාක්කුවක් තුළ බහා ගෙන යනු ලබන උද්‍යානයක් බඳු ය.

## A book is like a garden carried in a pocket.




**අපිට ජීවිතේ ඉගෙන ගන්න තියෙන්නේ මිනිස්සුන්ගෙන් විතර ද? අපිට සත්තු දිහා බලලා ඉගෙන ගන්න යමක් නැති ද? අනන්ත අප්‍රමාණවත් එවැනි කාරණා අපේ ඇසට නෙත ගැටෙනවා. නමුත් ඒවා පාඩම් විදියට අපගේ මනසට යන්නේ නෑ. ඒ නිසා තමයි අපි අද හිතුවේ සිංහයාගෙන් අපට ඉගෙන ගන්න යමක් තියෙනවා ද කියන එක ඔබගේ මතකයට ගේන්න. බලන්න. විශ්වාසය පිළිබඳ සිංහයා අපට උගන්වන පාඩම මොකක් ද කියලා.**



# අනාගතය ජයගන්න සිංහයෙක් වගේ වැඩ කරන්න

කණ්ණාඩිය ඉස්සරහට ගිහින් හිටගත්තම ඔබට ඔබව පේන්නෙ මොන විදියටද? ඔබට ඔබව දැනෙන්නෙ මොන විදියටද? කණ්නාඩියේ ඔබේ ප්‍රතිරූපය මතු වෙනකොට ඔබට ඒක දැනෙන්නෙ මොන විදියටද කියලා පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද? ඔබ දන්නවද සිංහයා කියන සතාව කැලෑවෙදි දකිනකොට අනිත් සත්තුන්ට මොනවද හැගෙන්නෙ කියලා? අනිත් සියලුම සතුන් සිංහයාව දැක්කම දුවනවා. ඒ වගේම සිංහයාට කැලෑවෙ රජ්ජුරුවො විදියට ගරු කරනවා. මේ ලෝකෙ හැම තැනකින්ම ඉගෙන ගන්න දේවල් තියෙනවා. ස්වභාදහමත් අපට අපූරු පාඩම් උගන්වනවා. සතුන්ගෙ ලෝකෙ රජා වෙන සිංහයාට අනෙකුත් සියළුම සතුන් ගරු කරන්නෙ ඇයි? මුළු කැලෑව පුරාම අනෙකුත් සියළුම සතුන් අභිබවමින් සිංහයාට නායකයා ලෙස නමක් පටබැඳිලා තියෙන්නෙ ඇයි? රජ්ජුරුවො කියලා හඳුන්වන්නෙ ඇයි? අනෙකුත් සියළුම සතුන් සිංහයා හමුවේ යටපත් වෙන්නෙ ඇයි? ඔබ කලින් මේ ගැන හිතලවත් තියෙනවද? ජීවිතයේ කිසියම් හෝ අවස්ථාවක සිංහයාගෙන් ජීවිතයට යමක් ගන්න ඔබට හැකියාවක් ලැබිලා නැත්නම් ඒ ගැන ඔබට කියාදෙන්නයි අද ලිපිය ඔබට ඉදිරිපත් කරන්නේ. සිංහයෙක් වගේ ජීවත් වෙන්න. සිංහයාගෙ න් ජීවිතයට යමක් ගන්න.

සිංහයා කැලේ නායකයා විදියට හැමෝම අඳුරග න්නවා. මොකක්ද සිංහයාට කැලෑවෙ නායකත්වය දරන්න තියෙන සුදුසුකම? නායකයෙක් වෙන්න මොකක්ද සිංහයා සතුව තිබෙන ලොකුම සුදුසුකම? නායකයෙක් විදියට වැඩ කරන්න අත්‍යාවශ්‍යම වෙන ආයුධය සිංහයා සතුව තියෙනවා. ඒ Spirit එක තියෙනවා. ඔබ හිතන්නෙ මේ Spirit එක මොකක් කියලද? ඒ තමයි අපි හැමවිටම කතා කරන Attitude එක. එහෙම නැත්නම් ආකල්පමය සාධකය.

සිංහයා හමුවේ අනිත් හැම සතෙක්ම පිටිපස්සට යනවා. ඔබ නිකමට කල්පනා කරලා බලන්න. කැලේ ඉන්න උසම සතා ජිරාෆ් මිසක් සිංහයා නෙවෙයි. උසින් ගත්තම වැඩිම උසක් තියෙන සතා සිංහයා නෙවෙයි. ඒ වගේම කැලේ ඉන්න විශාලතම සතා අලියා මිසක් සිංහයා නෙවෙයි. ඒ වගේම කැලේ ඉන්න ශක්තිවන්තම සතා, ඇතැම්විට Heaviestu සතා රයිනෝසිරස් මිසක් සිංහයා නෙමෙයි. ඇතැම්විට කැලේ ඉන්න නුවණක්කාරම, Smartest ම සතා නරියෙක් හෝ වෘකයෙක් වෙන්න පුළුවන්. හැබැයි ඒ සිංහයා නෙමෙයි. හැබැයි මේ සත්තු ඔක්කොම සිංහයාව දැක්කම දුවනවා. ඇයි? තමන් පිළිබඳ සිංහයා සිතන ආකාරය, ඒ ආකල්පමය සාධකය තමයි ඒකට හේතුව. ඔබට ඒ බව පැහැදිලි කරන්න උදෘත උපුටනයක් සම්බන්ධ කරගන්න අපි හිතුවා. නැපෝලියන් බොනපාට් කියන ශ්‍රේෂ්ඨ රණකාමියා වරක් කියනවා, "ඔබ සිංහයන් සිය දෙනෙකුගේ නායකත්වය එක සුනඛයෙකුට පවරනු ලැබුවහොත්, සිංහයින් සිය දෙනාම යුධ බිමේදී සුනඛයින් සේ මියදෙනු ඇත. ඒ වගේම ඔබ සුනඛයින් සිය දෙනෙකුගේ බලකායක් තනා එහි නායකත්වය සිංහයෙකුට ලබා දුනහොත් සුනඛයින් සිය දෙනාම යුධ බිමේදී සිංහයින් සේ සටන්වදිනු ඇත" කියලා. ඔබට තේරෙනවද, සිංහයෙක් නායකත්වය ලබා දෙන දෙනකොට, සිංහයා කණ්ඩායම මෙහෙය වනකොට ප්‍රතිඵලය කොයි තරම් වෙනස් වෙන්නට පුළුවන්ද කියලා. මේ හා සමාන තවත් කියමනක් තිබෙනවා. ඒ තමයි, "බැටළුවන් සිය දෙනෙකුට නායකත්වය දෙන සිංහයෙකුට, සිංහයන් සිය දෙනෙකුට නායකත්වය දෙන බැටළුවෙකුගේ යුධ කණ්ඩායමක් පරාජයට පත් කරන්න පුළුවන්" කියලා. මෙතන කියවෙන්නෙත් ඒ ආකල්පමය සාධකයමයි.

ටිකක් හිතන්න. ඇයි මේ ආකල්පමය සාධකය සිංහයාට මේ තරම් හොඳින් ප්‍රතිඵල අත්පත් කර ගැනීමට වැදගත් වෙන්නෙ? සිංහයා කියන සතාට ඉතාමත්ම උසින් යුතු, තමාට වඩා ශරීර බරින් යුතු ඒ වගේම තමාට වඩා ශක්ති සම්පන්න භාවයෙන් යුතු අලියෙක් දැක්කම මොනා හිතනව ඇත්ද? උගට මොනව දැනෙනව ඇත්ද? උග කල්පනා කරන්නෙ එක දෙයයි. "අන්න මගෙ ආහාරය තියෙනවා. මට මෙයාව කන්න පුළුවන්, මට මෙයාව ගොදුරු කරගන්න පුළුවන්, අද මට මෙයාගෙ න් බඩගින්න නිවාගන්න පුළුවන්" අලියෙක්ව දැක්කම සිංහයෙක්ට හැගෙන්නෙ, දැනෙන්නෙ එහෙම. ඒ වගේම වඩාත්ම පුදුම සහගත කාරණාව වෙන්නෙ, අලියා සිංහයාට වඩා උසයි. අලියා සිංහයාට වඩා බරයි. ඒ වගේම අලියා සිංහයාට වඩා ශක්ති සම්පන්නයි. නමුත්, අලියට සිංහයෙක් දැක්කම බය හිතෙන්නෙ ඇයි? ඇයි අලියෙක් සිංහයෙක්ව දැක්කම දුවන්නෙ? වෙන කිසිම හේතුවක් නිසා නෙමෙයි. අලියට දැනෙන්නෙ, මේ සතාට මාව ගොදුරක් බවට පත් විය හැකියි. මේ සතාට මාව ආහරයක් බවට පත් විය හැකියි. මෙන්න මේ කියන සාධකය තමයි සිංහයාව ජයග්‍රහණය කරා ගෙනියන්නෙ. අලියාට සිංහයා කෙරෙහි බියක් ජනිත කරවන්නෙ. වෙන කිසිම දෙයක් නෙමෙයි. ඒ නිසා ඔබ මතක තියාග න්න, ඔබේ විශ්වාසයන් තමයි ඔබේ ආකල්පයන් බවට පත් වෙන්නෙ. අලියට දැනෙනවා මේ සිංහයා මාව ගොදුරු කරගනී කියලා. ඒ වගේම සිංහයාට දැනෙනවා මට අලියව ගොදුරු කර ගැනීමට හැකියි කියලා. ඒ නිසා කොතරම් ශක්ති සම්පන්න වුණත්, කොතරම් බලසම්පන්න වුණත්, කොතරම් උසින් යුතු වුණත් අලියා සිංහයා හමුවේ පරදිනවා. අනිත් සියළුම සතුන් හමුවේ සිංහයා ප්‍රබලයා බවට පත් වෙන්නේ ඔන්න ඔය කාරණාව නිසා.

ටිකක් හිතන්න, ඔබ තුළ කොතරම් දුරට සිංහයා තුල තිබෙන මේ Spirit එක තියෙනවද? ඔබ අභියෝග යක් දැක්කම කොතරම් දුරට එය යටපත් කර ගත හැකි යැයි විශ්වාස කරනවද? විභාගයක් දැක්කම ඒක පරාජය කරන්න, ඒ අභියෝගය ජයගන්න පුළුවන් සහ මේ විභාගය දිනන්න පුළුවන් කියන විශ්වාසය ඔබ තුළ ඇති වෙනවාද? රැකියාවේ උසස්වීමක් ලබා ගැනීමට හැකියාවක් තිබෙනවා නම්, ඒ පුරප්පාඩු වෙලා තියෙන ඉහළ පුටුව යම්කිසි දවසක මට පුරවන්න පුළුවන් කියන විශ්වාසය ඔබට තියෙනවාද? ජීවිතයේ යම් කිසි ඉලක්කයක් තියෙනව නම්, මට ඒ ඉලක්කය ජයගන්න පුළුවන් කියන විශ්වාසය ඔබ තුළ තිබෙනවාද? අන්න ඒ කාරණාව මත පමණක් ඔබට ජයග්‍රහණ වලට යන්නට හැකිද, නොහැකිද කියන කාරණය තීරණය වෙනවා. රූපවාහිනියෙ කාටූන් එකක් විදියට ගියපු මේ කතාව ඔයාටත් මතක ඇති. ඒ කාටූන් එකේ ඉන්නෙ පුංචි මී පැටියෙක්. මේ මී පැටියා හැමදාම තමන්ගෙ ගස් බෙනයෙන් එළියට ඇවිත් කෑම හොයාගෙන එන්න යනකොට එක දවසක් ඒ අවට ඉන්න පූසෙකුගෙ හඬකට බය වෙලා ආපහු බයෙන් දුවන් ඇවිත් ගස් බෙනේට රිංගනවා. ඒ ගමනෙදි මී පැටියව කටු පඳුරු වල පැටලෙනවා. උගට තුවාල වෙනවා. උග ගස් බෙනේට රිංගලා බයෙන් ගැහි ගැහී ඉද්දි මේ ගහේ ඉන්න වෘක්ෂ දේවතාවට මේ මී පැටියා දැක්කම දුක හිතෙනවා. වෘක්ෂ දේවතාවා මී පැටියගෙන් අහනව පූසගෙ හඬට බය වෙලා දිවුවෙ ඇයි කියලා. ඒ වෙලාවෙ මී පැටියා කියනවා පූසට බය නිසා කියලා. දේවතාවා ආයෙත් මී පැටියගෙන් අහනවා ඇයි පූසන්ට බය කියලා. උග කියනවා, "දේවතාවන් වහන්ස තේරුම් ගන්න. පූසන්ට මීයො බයයි" කියලා. දැන් දේවතාවා විකල්පයක් විදියට මේ මී පැටියව පූසෙක් බවට පරිවර්තනය කරනවා. එතකොට ඊළඟ දවසෙ කෑම හොයාගෙන අර බෙනෙන් පිටත් වෙන්නෙ මී පැටියෙක් නෙමෙයි. පූසෙක්. එතකොට අනිත් පූසා කෑගහන සද්දෙ ඇහිලා මේ හොඳින් වැඩුණු පූසා වෙනදා වගේම බය වෙලා දුවගෙන ඇවිත් ගස් බෙනේට රිංගනවා. දේවතාවට හරි පුදුමයි. දැන් මේ පූසා තවත් පූසෙක්ගෙ හඬට බය වෙන්නෙ ඇයි? ඊට පස්සෙ මේ දේවතාවා පූසෙක් කරපු මී පැටියව බල්ලෙක් බවට පත් කරනවා. ඊළඟ දවසෙ ගස් බෙනෙන් පිට වෙලා යන්නෙ මීයෙක්වත්, පූසෙක්වත් නෙමෙයි. බල්ලෙක්. ඒත් ඒ බල්ලා එදත් අර පූසගෙ හඬ ඇහුනම ආයෙත් දුවගෙන එනවා. මේ දවසෙ දේවතාවා තවත් වරමක් දෙනවා. පූසෙක් විදියට, බල්ලෙක් විදියට වෙනස් කාපු මීයව ඊළඟට සිංහයෙක් බවට පරිවර්තනය කරනවා. දැන් සිංහායා බොහොම උජාරුවෙන් ගොදුරු හොයාගෙන යන්න ගස් බෙනෙන් එළියට එනවා. නැවතත් අර පූසා කෑගහනවා. සිංහයා ආයෙත් අටු පඳුරු වල පැටලෙමින්, වැටි වැටී හයියෙන් දුවගෙන ඇවිත් බෙනේට රිංගන්න උත්සාහ කරනවා. දේවතාවා කම්පාවට පත් වෙලා හිතනවා ඇයි ඔබව සිංහයෙක් බවට පත් කළත් තාමත් පූසෙකුගෙ හඬට බය කියලා. ඔබව කොතරම් පරිභාහිරව සිංහයෙක් බවට පත් කළත් තාමත් ඔබ තුළ තිබෙන්නේ ඔබ මීයෙක් කියන විශ්වාසය. ඒ නිසයි ඔබ මේ ආකාරයෙන් බියට පත් වෙන්නෙ. ඔබේ ශරීරය කොතරම් වෙනස් කරත් ඔබේ විශ්වාසයන් වෙනස් වන්නේ නැතිනම් ඔබට කවදාවත් ඔය බියෙන් ජයගන්නට හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ වගේම ඔබට කවදාවත් රජ වෙන්නට ලැබෙන්නෙත් නැහැ. මේ දේවතාවා ඒ කාටූනය ඇතුලෙ අර මී පැටියට කියලා දෙනවා. සිංහයෙක් වගේ හිතන්න ලොකුවට හිතලා පොඩියට වැඩේ පටන් ගන්න ඔබට අනාගතයේ දවසක ජයගන්ට පුළුවන් වෙනවාමයි.

උගත් පුද්ගලයන් පහසුවෙන් පාලනය කළ හැක.
Educated individuals are easily governed

ජීවිතයට වදනක්

# සිංහල භාෂාවේ අගය කියා දුන් කුමාරතුංග මුණිදාස



ආදරණිය පුතේ, පුතාලා දන්නවද නිර්මාණාත්මක ලේඛකයෙක් කියන්නේ කාටද කියලා. නිර්මාණාත්මක ලේඛකයෙක් කියන්නේ කවි, ගීත, කෙටි කතා,කතාන්දර, නව කතා ලියන අයට.
ඒ විතරක් නෙවේ නාට්‍ය, ටෙලි නාට්‍ය වගේ ම නාට්‍ය පිටපත්, චිත්‍රපට පිටපත් ලියන අයත් නිර්මාණාත්මක ලේඛකයෝ කියලා අපි හඳුන්වනවා.
අද අපි කතා කරමු ශ්‍රේෂ්ඨ නිර්මාණාත්මක කවි සහ කතා නිර්මාණ ශිල්පියෙක් ගැන. ඒ තමයි, කුමාරතුංග මුණිදාස මහතා මෙතුමා පුතේ සිංහල භාෂාව සිංහලයන්ට අමතක වෙමින් තිබුනු කාලයක සිංහල භාෂාවේ අගය කියාපෑම සඳහා ලොකු පොඩි සියල්ලටම රසවිඳිය හැකි කවි කතා නිර්මාණය කරපු ශ්‍රේෂ්ඨ පඬිරුවනක්.
පුතාලා අදටත් රස විඳින නිර්මාණ අතරින් බොහෝ නිර්මාණ එතුමාගේ නිර්මාණ. හොඳින් බලන්න පුතේ කුමාරතුංග මුණිදාසයන් රචනා කළ පහත කවි පන්ති පුතාලා හොඳටම දන්නවා ඇති.
පුතාලා ගොඩාක් කැමති සතෙක් ගැන එතුමා නිර්මාණය කරපු පහත කවි පන්තිය රස විඳිමු.

■හාවා ගිය මඟ

හා හා හරි හාවා
කැලේ මැදින් ආවා
හිටගෙන ගහ ගාවා
වට පිට ඇහැ ලෑවා

කොළ දෙකටක් කෑවා
පැන් උගුරක් බීවා
තොල කට ලෙව කෑවා
ඉතින් ඇතැයි කීවා

පුතාලා 1 සහ 2 ශ්‍රේණිවල දී අකුරු සහ පිල්ලම් හුරු වෙන්න එතුමා නිර්මාණය කරපු පහත කවි පන්තිය අනිවාර්යයෙන්ම ගායනා කරලා ඇති.

■අකුරු මහිමය

ගස අග නා
අර රඳ නා
මලට ම නා
බොහොම හිනා

ගත වතු සුදු
වී පිරි සිදු
පොහොය නැතදු
සිල්ගත් බඳු

කුමරතුංග මුණිදාසයන් තම නිර්මාණ සිදු කළේ දරුවන් භාෂාව හැදෑරීම මුල් කර ගත් පටු චේතනාවෙන් නොවේ. ඔවුන්ගේ හදවත ගුණදම්වලින් පෝෂණය කර හොඳ දරුවන් කිරීමේ අරමුණිනි. පුතාලා හොඳින් ම දන්න 'සිරිමත්' කවි පෙළ ඊට හොඳම නිදසුනකි.

සිරිමත් මගෙ සකි
යහපත් ළමයෙකි
නුවණත් ඇත්තෙකි
වැඩටත් සමතෙකි

උදයම පුබුදී
මුහුණට දිය දී
කුල දෙවි නමදී
ගේ දොර හමදී

සියලු දේ තාක්ෂණීකරණය වන වර්තමාන ලෝකයේ මෙකී වටිනා නිර්මාණාත්මක ලේඛනවල වටිනාකම සුළුවට තකමින් සිටී. නමුත් කුමාරතුංග මුණිදාසයන්ගේ කවි නිර්මාණවල වටිනාකම නොනිමි පහණක් සේ කිසිදා නිම නොවේ. ඒ වගේම එතුමන්ගේ කවි නිර්මාණ මෙන් ම කතා නිර්මාණද ළමා ලෝකය රසවත් කළ බව නොරහසක්. ඉතින් අපි ඊළඟ දවසේ කුමාරතුංග මුනිදාස මහතා රචනා කළ කතා පොත් ගැන දැන ගනිමු.



සඳුනි නිශ්ශංක
ආනන්ද විද්‍යාලය
කොළඹ 10



# කොළඹ මහජන පුස්තකාලය

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල අතරින් කොළඹ මහජන පුස්තකාලය ප්‍රමුඛතම පුස්තකාලයක් ලෙස වර්තමානය වන විට හඳුනාගත හැක.මෙම පුස්තකාලය ආරම්භ වන්නේ වර්ෂ 1925 ජූලි මාසයේදීය.. කොළඹ 07, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවතේ පිහිටා ඇති මෙම මහජන පුස්තකාලයේ අංශ රැසක් යටතේ පාඨකයන්ට මහත් වූ සේවයක් සපයන පුස්තකාලයකි.මහජන පුස්තකාලයේ බැහැර දෙන අංශය,ළමා අංශය,වාර සඟරා අංශය,පුවත්පත් අංශය,විමර්ශන අංශය,විශේෂ එකතු අංශය,ජංගම පුස්තකාල අංශය යන අංශවලට අදාලව පොත්පත් සඟරා ආදිය ඇතුළත් කර ඇත.
දිනකට පොත් දොළොස්දාහකට අධික සංඛ්‍යාවක් පාඨකයන් විසින් බැහැර ගෙන යනු ලැබේ..මෙම බැහැර දෙන පුස්තකාලයේ පොත් දෙලක්ෂයකට අධික ප්‍රමාණයක් ඇත.සිංහල ,දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පුළුල් විෂය පරාසයකට අයත් පොත් මෙහි ඇතුළත්ව ඇත.දිනකට පුවත්පත් කියවීම සඳහාද විශාල පිරිසක් පුස්තකාලය වෙත පැමිණෙනු දක්නට ලැබේ.මෙය පුස්තකාලේ වඩාත් ජනප්‍රිය අංශය බවට පත්වී ඇත.
ළමා අංශයද පුස්තකාලයේ තවත් බහුලව භාවිත කරනු ලබන අංශයකි.ළමා පොත්පත් ලක්ෂයකට අධික සංඛ්‍යාවක් විෂය අනුව ගොනුකර තිබීම මෙහි දක්නට ඇත.ඊට අමතරව ළමා පුවත්පත් එකතුවක්ද මෙම පුස්තකාලය සතු වෙයි.මේ ලෙස පුවත්පත් සඟරා ආදියෙන් සමන්විත වූ මෙම පොත්ගුල දැනුම සොයන්නන්ට මහඟු ස්ථානයකි..පුංචිය ඔබත් කොළඹ මහජන පුස්තකාලය තුළින් ඔබේ දැනුම වර්ධනය කරගන්න..



මධූකා ජයසූරිය
ආනන්ද විද්‍යාලය
කොළඹ 10

ජීවිතයට වදනක්

## නායකයෙකුට සේවකයෙකුට වඩා දුර දැක්මක් තිබිය යුතු ය.

## A leader should be visionary and possess more foresight than an employee





# නවම් පුරපසළොස්වක පෙර පෝය වැඩසටහන

ආනන්ද විද්‍යාලයේ මුඛ්‍ය පරමාර්ථය බොදු බැති සිත දරුවන් තුළ ජනිත කරමින් නිසි අධ්‍යාපන රටාවකින් හෙබි පූර්ණ මිනිසකු දැයට ජනිත කරවීමයි. එහි එක් අංගයක් ලෙස කුඩා කල සිටම අනඳ බිමට පැමිණෙන දරුවන් පන්සලට, ස්වාමීන් වහන්සේලාගේ ඇසුරට මුහුකිරීමට ඇදුරු මඩුල්ල උත්සාහ දරයි. ඒ මග යමින් මෙවරත් නවම්පුර පසළොස්වක පොහොය දිනයේ පෙර පොහොය වැඩසටහන වෙනස් අයුරකින් ඉදිරිපත් කිරීමට 2 ශ්‍රේණියේ ගුරු මහත්මීන් සූදානම් වුණා. ඔවුන් මෙවර පන්සලටම ගොස් ඒ අත්දැකීම් දරුවන්ට ලබා දීමට කටයුතු කළා. 2 ශ්‍රේණියේ පුතාලා සුදුවතින් සැරසිලා 2025/02/11 වන දින උදෑසන කැටවල මුල්ල ජයසේකරාරාමය පන්සල වෙත පියගුවා. පන්සලට ගොස් පූජාවට පෙර වතාවත් වල නිරත වුණු පුතාලා ඉතා සතුටින් සංවර සීලීව කටයුතු කළා. පසුව ඔවුන් බලංගොඩ චන්ද්‍රරතන ස්වාමීන් වහන්සේ විසින් පවත්වනු ලැබූ බෝධි පූජා වැඩසටහනට සම්බන්ධ වුණා. දෙවනුව සුගතවංශ පොඩි හාමුදුරුවන් වහන්සේ විසින් පවත්වන්නට යෙදුණු ධර්ම දේශනයට සවන් දුන්නා. පසුව සියලු දෙනාම මල් ආසන පිරිසිදු කර නැවතත් පාසල වෙත ඉතාම සතුටින් ගමන් කළා.
















# Rising Above the rest, Aiming for the Best.

" Abiru Paragaha Anga & Abinu Paragaha Anga are identical twin brothers born in 2016, entered for their primary studies to Ananda College Colombo in 2021 and their very first school teacher was Mrs. Chathurangani Gunawardana for Grade 1 & 2 Green class. Having successfully passed to Grade 3 - 1 in 2023 Mr. Janaka Ramawickrama became their class teacher for next two years. Under the guidance of both class teachers they concentrate their primary education and strengthen their Tennis life as well.

In their Tennis life both of them were recognized by the school tennis on their very first round of selection as potential candidates to be the considerable tennis players in years to come. With that recognition they both have been selected under 7 Red ball category school team and continue to undergo lots training in the school tennis courts with coaches. The Head coach was Mr. Tharindu Perere and Assistant Coach Mr. Hareendra. As they continue to undergo trainings, under guidance of the coaches they both managed to participate cool tennis tournaments organized by Sri Lanka Tennis association (SLTA). During the past 2 years have been able to positioned themselves at PRO level with approximately 40 championships.

Ananda college Red ball team became the 01st Runners - Up at All Island tournament in 2023. Orange ball team placed in 02nd runners - up at All Island tournament in 2024 during the series tournaments they both have provided effective leaderships to the teams and carried out their duties in best capacities as Captain & Vice Captain of the teams.

So in 2025 both them continue to play under Orange ball category and many more tennis games to be played which are lined up in this year.

Abiru & Abinu have been strength to Ananda tennis and they have made significant contribution to the Ananda tennis for a very short time period and we wish them success in their tennis journey"







# කරාතේ ක්‍රීඩාවෙන් ජයගත් පුංචි හපන්නු

වසර ගණනාවක පටන් කරාතේ ක්‍රීඩාවෙන් කොළඹ ආනන්ද විද්‍යාලයට ජයග්‍රහණ රැසක් අත් කර ගැනීමට හැකියාව ලැබී ඇත. විදෙස් රටවල පවා ශ්‍රී ලාංකීය නාමය කරාතේ ක්‍රීඩාව තුළින් ඔසවා තැබීමට කොළඹ ආනන්දයේ අනඳ පුතුන් සමත් විය.

පසුගිය පෙබරවාරි පළවෙනිදා මරදාන සෙන් ජෝසප් විද්‍යාලයේ පැවැති 2025 මින් සෝ ජාත්‍යන්තර කරා තේ ශූරතාවලියේ ජයග්‍රහණ රැසක් ලබා ගැනීමට අනඳ විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ යෙනුත් රන්මිර සිසුවා සහ ජනුල් සූරියආරච්චි සිසුවා සමත් විය.

අවුරුදු 10 පහළ පිරිමි (level 01 - 10 Kyu) කාතා තරඟයේ ප්‍රථම ස්ථානය ලබා රන් පදක්කමක් දිනා ගැනීමට යෙනුත් රන්මිර සිසුවා සමත් විය. අවුරුදු 10 පහළ පිරිමි (level 01 - 06 Kyu) කාතා තරඟයේ තුන්වන ස්ථානයේ ලෝකඩ පදක්කම ද අවුරුදු 10 පහළ - පිරිමි කෝමිතේ තරගයේ තුන්වන ස්ථානයේ ලෝකඩ පදක්කම ද දිනා ගැනීමට ජනුල් සූරියාරච්චි සිසුවා සමත් විය. මෙම තරගකරුවන් පසුගිය වසර වලද කරාතේ ක්‍රීඩාව තුළින් දස්කම් දැක්වූ අනඳ පුතුන් ය. තව තවත් මෙවැනි ජයග්‍රහණ ලබා අනඳ නාමය රට පුරා මෙන්ම රටරට පුරා ද රැගෙන යාමට ආනන්ද පුතුන්ට හැකි වේවා යන පැතුම එක් කර සිටිමු.